ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2013 පෙබරවාරි 12 වැනි දින |

**මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 පෙබරවාරි**

2012 පෙබරවාරි/මාර්තු මාසවල ක්‍රියාත්මක කරන ලද දැඩි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම 2012 සම්පූර්ණ වසර සඳහා වන මුදල් සහ විදේශීය අංශයන්ගේ දත්ත තුළින් පිළිබිඹු වේ. මුදල් අංශය තුළ, පුළුල් මුදල් සැපයුම 2012 අප්‍රේල් මස පැවති එහි උච්චතම වර්ධනය වූ සියයට 22.9 සිට දෙසැම්බර් වන විට සියයට 17.6 ක් දක්වා අඛණ්ඩවම මන්දගාමී විය. පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය ද 2011 අග පැවති සියයට 34.5 සිට සියයට 17.6 ක් දක්වා අඩුවිය. කෙසේ වෙතත්, රජය සහ රාජ්‍ය සංස්ථා බැංකු අංශයෙන් ලබාගත් ණය ඉහළ යාම නිසා සමස්ත දේශීය ණය ප්‍රසාරණය 2012 අවසානය වන විට සියයට 21.7 මට්ටමේ පැවතුණි. දැඩි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස විදේශීය අංශය තුළ ඛනිජ තෙල් නොවන ආනයන සැලකිය යුතු ලෙස පහළ වැටුණ අතර එය 2012 වෙළෙඳ ගිණුමේ හිඟය අඩු කිරීමට හේතු විය. ඉහළ යන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, සේවා ලැබීම්, සහ ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම් සඳහා වූ ලැබීම්වල ප්‍රතිඵලයක් ලෙස ගෙවුම් තුලනයේ අතිරික්තයක් වාර්තා විය. ඒ අනුව රටේ විදේශ සංචිත ප්‍රමාණය ඉහළ ගිය අතර, රුපියල අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශක්තිමත් විය.

2012 පෙබරවාරි/මාර්තුවල හඳුන්වාදුන් ප්‍රතිපත්ති සමූහයේ, සාර්ව ආර්ථික ස්ථායීතා අරමුණු සාක්ෂාත් වීමත් සමගම, 2012 දෙසැම්බර් මාසයේ දී මහ බැංකුවට එහි මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමට හැකි විය. 2012 දෙසැම්බර් මාසයේ දී ප්‍රතිපත්ති පොලී

අනුපාතික පහළ දැමීම සහ ණය සඳහා වූ සීමාව ඉවත් කිරීම තුළින් 2013 දී ආර්ථිකය, එහි පූර්ණ විභව මට්ටම කරා ළඟාවීමට අවශ්‍ය අනුබලය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2012 දී වාණිජ බැංකු පෞද්ගලික අංශයට ලබාදුන් රුපියල් බිලියන 352 ක් වූ ණය ප්‍රමාණයට සාපේක්ෂව 2013 දී පෞද්ගලික අංශයට ලබාදෙන ණය ප්‍රමාණය රුපියල් බිලියන 435 කින් පමණ (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සියයට 18.5) වැඩිවනු ඇතැයි මහ බැංකුව අපේක්ෂා කරයි. අපේක්ෂිත ආර්ථික කටයුතුවල ප්‍රසාරණයට මෙවැනි ණය වර්ධනයක් ප්‍රමාණවත් වන බැවින් එය 2013 දී ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනකාරී පීඩනයක් ඇති කිරීමට දායක නොවනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

මේ අතර, මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණයට ප්‍රතිචාර දක්වමින් කෙටිකාලීන මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතික තියුණු ලෙස අඩු වූ නමුත්, තැන්පතු අනුපාතික සහ ණය පොලී අනුපාතික මෙතෙක් ප්‍රමාණවත් අඩුවීමක් පෙන්නුම් කර නොමැත. කෙසේ වුවද, පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා උත්තේජනයක් ලබාදෙමින් මෙම අත්‍යවශ්‍ය ගැලපුම් ඉදිරි සතිවල දී දක්නට ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අතරම, අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඉහළ ගිය එළවළු මිල ගණන්, පරිපාලිත මිල ගණන්හි සිදුකළ සංශෝධනයන් සහ පෙර වසරෙහි පදනම් බලපෑම හේතුකොට ගෙන 2013 ජනවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සියයට 9.8 දක්වා ඉහළ ගිය නමුත් වසර 4 ක් මුළුල්ලේම උද්ධමනය තනි අගයක මට්ටමේ පැවතුණි. එළවළු මිල ගණන් දැනටමත් දැඩි ලෙස පහළ ගොස් ඇති නමුත්, වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය පෙබරවාරි මාසයේදී ද දැනට පවතින මට්ටමේ පැවතියද ඉන්පසුව මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහත සඳහන් කරන ලද කරුණු සැලකිල්ලට ගනිමින් 2013 පෙබරවාරි 11 වැනි දින පැවති සිය රැස්වීමේ දී දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් එලෙසම පවත්වා ගැනීම සුදුසුයැයි මුදල් මණ්ඩලය තීරණය කළ බැවින් මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.5 සහ සියයට 9.5 ක් ලෙස නොවෙනස්ව පවතිනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.